# පුස්කොළ පොත් එකතු පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක් (අනුරාධපුර දිස්ත්‍රික්කය හා මාතර දිස්ත්‍රික්කයන්හි විහාරස්ථාන දෙකක් අසුරෙනි)

පාතකඩ රේවත හිමි[1]

## හැඳින්වීම

මිනිස් සමාජයේ භාෂණය හා ලේඛනය එකවර ඇති වූ අංශද්වයක් නොවන බවත්, ප්‍රථමයෙන් භාෂණයත් දෙවනුව ලේඛනයත් ඇති වූ බව ප්‍රතිග්‍රාහිත මතයයි. ඔවුහු වසර දහස් ගණනක් තිස්සේ කථනය මගින් ඔවුනොවුන් අතර සන්නිවේදන සබඳතා ගොඩනගා ගත්හ. පසු කාලීනව තමා දුටු දේ චිත්‍රයට නැඟීමට ඔවුහු පෙළඹුනහ. මෙලෙස චිත්‍රාක්ෂර (Pictograph) හෙවත් රූපාක්ෂරයන්ගෙන් ආරම්භ වී පසුව ලඝු සංකේත අක්ෂර (Logograph) ශබ්ද සංකේත අක්ෂර (Syllabic Writing) ශබ්දාක්ෂර (Phonems) දක්වා ඒවා වර්ධනය කොට ගෙන ඇති අතර අනතුරුව අකාරාදී ලේඛනයටත් (Alphabetic Writing) වර්තමානයේ භාවිත වන අක්ෂර ලේඛනයටත් (Syllabic Writing) හුරු පුරුදු වී තිබේ.

ක්‍රි. පූ. තුන් වන සියවසේදී මහින්දාගමනයත් සමඟ මෙරට ලේඛන කලාවේ විධිමත් ආරම්භයක් සිදුවිය. නමුත් ඊට පෙර පවා මෙහි හසුන්පත් වැනි ලේඛන රචනා කොට ඇති බව ඓතිහාසික මූලාශ්‍ර සනාථ කරයි. විජය කුමරු ඉන්දියාවේ සිටි තම සොහොයුරු සුමිත්ත කුමරුට හසුනක් යැවූ බව මහාවංශය දක්වයි. එහිම සඳහන් පරිදි අභය රජු පණ්ඩුකාභය කුමරුට හසුනක් යවා ඇත. (සිංහල මහාවංශය, 1994) ඔවුන් ඒ සඳහා යොදා ලැබුවේ ඉන්දියානු බ්‍රාහ්මීය අක්ෂර කලාවයි. (හෙට්ටිආරච්චි, ඩී. ඊ. සංස්., 1963)

භාරතයෙන් ආභාසය ලැබූ මෙරට ලේඛන කලාව එහි නිපන් පුස්කොල පොත ද ප්‍රධාන ලේඛන මාධ්‍ය බවට පත් කර ගන්නා ලදී. තාල වර්ගයට අයත් ගස්වල පත්‍ර භාවිතා කොට පුස්කොල පොත නිර්මාණය කර ගනී. එවැනි ගස් වර්ග තුනකි. තල (Talipotpalm-Coryphaumbraculifera or C. Taliera). තල් (Palmyra Palm-Borassus Flabellifera), සහ ලොන්ටා (Lonta palm-Corypha utan) යනු එම ගස් වර්ග තුනයි. (ලගමුව, ආරිය, 2006 ) නමුත් ලංකාවේදී තල සහ තල් යන දෙවර්ගය මේ සඳහා යොදා ගත් බව පැහැදිලිය. එයින් තල් ගස උතුර, උතුරු මැද, නැගෙනහිර සහ හම්බන්තොට ප්‍රදේශවලත් තල ගස සබරගමුව, වයඹ, ඌව, මධ්‍යම පළාත්වලත් බහුල වශයෙන් ව්‍යාප්ත වී තිබේ.

[1] prewatha@hotmail.com

පුස්කොළ ලේඛන බහුල වශයෙන් සම්පාදනය වූයේ මෙරට විහාරාරාම ආශ්‍රිතවයි. එබැවින් බෞද්ධ පොතපත ප්‍රමුඛතම පුස්කොල ලේඛන බවට පත් විය. වළගම්බා රාජ සමයේදී (ක්‍රි. පූ. 89-77) භික්ෂූන් වහන්සේ විසින් එතෙක් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන ආ ත්‍රිපිටක ධර්මය අනාගතයේ විය හැකි උවදුරු සලකා මාතලේ අලුලෙන් විහාරයේදී ග්‍රන්ථාරූඪ කරන ලදී. (මහා වංශය, 33 පරි. 103 ගාථාව) එතැන් පටන් මෙරට ප්‍රධානම ලේඛන මාධ්‍ය බවට පත් වූයේ පුස්කොල පොතයි. යුරෝපීය ජාතීන් විසින් කඩදාසිය මෙරටට හඳුන්වා දෙන තෙක්ම පුස්කොල ලේඛනය ප්‍රමුඛ කොට සලකනු ලැබීය.

## පුස්කොළ පොත් නිර්මාණකරණය

තල් ගසේ ගොබය පුස්කොළ පිළියෙළ කරගැනීම සඳහා යොදා ගනී. ගොබයෙන් කොළ එකිනෙක වෙන් කරගෙන මුලින්ම කරනු ලබන්නේ ඉරටු ඉවත්තර කර ගැනීමයි. අනතුරුව එක් එක් කොළ ගෙන රවුමට ඔතනු ලබයි. මේවා හඳුන්වනු ලබන්නේ "**වට්ටු**" නමිනි. අනතුරුව මෙම වට්ටු කල්දේරමක දමා තම්බාගනු ලැබේ. මේ සඳහා පැපොල් කොළ හා පැපොල් ගැට ද අන්නාසි කොළ ද බිලින් කොළ ද ප්‍රමාණවත් පරිදි යොදා ඒ මත වට්ටු දමා හැලිය පිරෙන්නට ආසන්න වූ විට ඒ මත කැප්පෙටියා කොළ ද යොදයි. අනතුරුව හැලියේ කට වැසෙන්නට කපු රෙදි කැබැල්ලකින් ඔතා පැය දෙක තුනක් මද ගින්නේ කොළ තම්බා ගනු ලැබේ.

තල කොළ වට්ටු තැම්බී ඇතිදැයි බැලීමට එක කොළයක් ගෙන කෙළවරකින් කඩතොලු කොට බලයි. පිටි ගතියක් මතුවේනම් ප්‍රමාණවත් තරම් තැම්බී ඇත. ඊටපසු ගිනි නිවා දමා උණු ජලය සිසිල් වන තෙක් තල කොළ හැලියේම තබනු ලැබේ. එසේම හොඳින් සෑ ඇති රය තුනක් ද පින්නේ තබනු ලබයි. මෙ සඳහා තල කොළ දිගහැර රැහැනක වනා තැබේ.

තම්බා සකස් කරගත් තල කොළ ඉන්පසු ලිවීමට සුදුසු පරිදි ඔප දමා ගත යුතුය. මේ සඳහා හොඳින් පිරිමදින ලද මතුපිට සිනිඳු රවුම් ලීයක් යොදා ගනී. හරහට දමන ලද ඔප මට්ටම් කරන ලද එම ලීයෙහි පොල් තෙල් තවරා ඒ මත කොළය අදිනු ලබයි. එවිට තල කොළය නැමුණුතැන් දිගහැරී ඔපමට්ටම් වී ලිවීමට සුදුසු පරිදි සිනිඳු මතුපිටක් සහිත වේ. තල කොළයේ දෙපැත්තින්ම මෙලෙස ඔප දමා ගත් පසු නැවතත් පිරිසිදු ජලයෙන් සෝදාගනු ලැබේ. එලෙස සකස් කරගත් තල කොළය ලිවීමට සුදුසු වන්නේය.

මදින ලද තල කොළ ඉන් පසු පිළිවෙලෙකට පොතක් බවට පත්කර ගත යුතුය. කොළ එක ප්‍රමාණයකට කපා ගත් පසු ඒවා තට්ටුව බැගින් ගෙන නූලකින් එකට සම්බන්ධ කිරීම මීලඟට කරනු ලබයි. ඒ සඳහා සමාන දුරකින් සිදුරු දෙකක් විදගනු ලැබේ. මෙලෙස සිදුරු සකස් කිරීම "**සුළී කැලීම**" යනුවෙන්

පැරැන්නන් විසින් හඳුන්වා දී තිබේ. පොත් කම්බාව හෙවත් ලී පුවුරු දෙකක් තලපත් මිටියේ දෙපසට යෙදීම ද සාමාන්‍ය ක්‍රමයයි.

මුද්‍රිත පොතපත සඳහා ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමේදී යම් සම්මත ක්‍රමවේදයන් තිබුණ ද පුස්කොළ පොත් සඳහා එය එසේ නොවේ. එබැවින් සෑම පොතකම භෞතික හා සන්දර්භාගත තොරතුරු මෙලෙස සංක්ෂේපයෙන් මෙහිදී ඉදිරිපත් කෙරේ.

**෴අග්ගික්ඛන්ධොපම සූත්‍රය෴ (ස.)(1)**

| | | |
|---|---|---|
| භාෂාව | : | පාලි |
| පත්ඉරු | : | 11 |
| අංකනය | : | ක සිට කෙ දක්වා |
| දිග | : | සෙ.මී. 45 |
| පළල | : | සෙ.මී. 5.5 |
| කම්බය | : | දැව |
| සකිය | : | තඹ |
| හුය | : | කපු |
| කාලය | : | 19 වන සියවස |
| ආරම්භය | : | |

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ෴ එවමෙමසුතං එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරති මහතා භික්ඛුසඞෙඝන සද්ධිං අද්ධසා ඛො භගවා අද්ධාන මග්ගං අග්ගික්ඛන්ධං අදිත්තං සම්පජ්ජලිතං ජොති භූතන්ති එවං භනෙත. ෴

### අවසානය

තස්මාතිහි භික්ඛවෙ එවං සික්ඛිතබ්බං යෙසං මමචචයං පරිභුඤ්ජාමි චීවර පිණ්ඩපාත ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරං තෙකාරා මහප්ඵලාභ විස්සන්ති මහානිසංසාය අම්හාකංචෙවායං පබ්බජ්ජා අවජ්ජා භවිස්සති.෴

### නිගමනය

අප අධ්‍යයනයට පාත්‍ර වූ පුස්කොල පොත් සියල්ල වසර සියයේ සිට තුන්සීය දක්වා කාල සීමාවකට අයත් වන අතර පාලි, සිංහල, සංස්කෘත හා දෙමළ භාෂාවන්ගෙන් රචනා කොට ඇත.

පුස්කොළ පොත් වල විශේෂත්වය නම් වර්තමාන ග්‍රන්ථ ප්‍රකාශනය මෙන් නොව එහි කතුවරයා එතරම් වැදගත් කොට නොසැලකීමයි. එබැවින් මේවායේ කතුවරු සෙවීම අතිශයින් දුෂ්කර කටයුත්තකි.

පොත්වල සන්දර්භය ගෙන බැලීමේදී නමස්කාර පාඨය පොදුවේ ආරම්භක වාක්‍ය වශයෙන් භාවිත කර අවසානයේ පුණ්‍යානුමෝදනාවකින් අවසන් කරනු ලැබේ. තවද පත්තිරු අංකකරණය අක්ෂර භාවිතයෙන් සිදු වී තිබේ.

මෙම පොත්වල ප්‍රමාණයන් දෙස අවධානය යොමු කිරීමේදී ඒවායේ පළල ඒකාකාරී තත්වයක පැවතුණ ද දිගින් සෙ. මී. 60 සිට සෙ. මී. 6 දක්වා වූ විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්ත පොත පත දැකගත හැකිවිය.

සමස්ථයක් ලෙස බොහෝ පොත්පත් බෞද්ධ ග්‍රන්ථයන් වන අතර පොදුවේ සියල්ල මෙලෙස වර්ග කීපයකට බෙදා දැක්විය හැක.

ත්‍රිපිටක පොත්
වංශකථා
කවි පොත්
බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ
සන්දේශ කාව්‍යය
ජෝතිෂ්‍ය ග්‍රන්ථ
වෙද පොත්

දැනට ශ්‍රී ලංකාවේ විහාරස්ථාන පෞරාණික ස්ථාන කෞතුකාගාර සහ පුද්ගල සන්තකව පවතින සියලු පුස්කොළ පොත් පිළිබඳව මෙතෙක් ක්‍රමවත් ග්‍රන්ථවිද්‍යාත්මක අධ්‍යනයක් හෝ සංගණනයක් හෝ කර නොමැති අතර එවැනි සමීක්ෂණයක් සිදු කිරීම පුස්කොල ලේඛන සංරක්ෂණය විෂයෙහි අත්‍යවශ්‍ය කරුණකි. ඊට ආරම්භයක් වශයෙන් මෙම අධ්‍යයනය යොදා ගත හැකිය. තවද දුර්වල වී ඇති පොතපත ශක්තිමත් කොට හොඳ තත්වයේ පවතින ලේඛන තවදුරටත් ආරක්ෂා කර ගැනීම සඳහා සංරක්ෂණ ක්‍රියාමාර්ගයක් ගැනීම බලධාරීන්ගේ වගකීමකි.

**ප්‍රමුඛ පදඃ** ලේඛන කලාව, ලේඛන මාධ්‍යයන්, පුස්කොළ පොත්, ග්‍රන්ථ විද්‍යාත්මක, අධ්‍යයනය

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

අදිකාරි, අබයරත්න (2000). *ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහ සඟන*.තෘතීය මුද්‍රණය. නුගේගොඩඃ තිම්ර.

අභයසිංහ, ඒ.ඒ. සහ රාජපක්ෂ, ආර්. එම්. ඩබ්. සංස්. (1989). *භාෂා විඥාන : භාෂා විෂයක ලිපි සංග්‍රහය,* රදාවාන. අභයරත්න මුද්‍රණාලය.

අරංගල, රත්නසිරි, (1992). *සිංහලයේ සම්භවය සහ ජුලියස් ද ලැනරෝල්ගේ සිංහලයෙහි න-ණ-ල-ළ භාවිතය*, කොළඹ. ගොඩගේ.

අලගියවන්න, පුවතිසි සම්. (2004). *සංස්කෘත සිංහල ශබ්දකෝෂය*. කොළඹඃ සූරිය ප්‍රකාශකයෝ.

අහුබුදු, අරිසෙන් (2000). *අරුත නිරුත*,.කොළඹඃ සීපා.